# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## වාර්ෂික වාර්තාව හා ගිණුම්

## 2016

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,
නො. 27, වොක්ෂෝල් මන්දිරය,
වොක්ෂෝල් පාර,
කොළඹ - 02.

2018.07.20

ලේකම්තුමා,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,
73/1, ගාලු පාර,
කොළඹ - 03.

ලේකම්තුමනි,

**<u>2016 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව හා ගිණුම් - ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව</u>**

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තියේ නියමයන්ට අනුකූලව පහත සඳහන් ලේඛන සමග 2016 වර්ෂය සඳහා වූ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමු.

අ) 2016 වර්ෂයේ මූල්‍ය වාර්තා
ආ) විගණකාධිපති වාර්තාව
ඇ) යථෝක්ත (ආ) පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම්

ස්තූතියි.

මෙයට විශ්වාසී,
**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

අත්සන් කලේ,
**රියාස් එස්. සාලි,**
**සභාපති**

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**අන්තර්ගතය** **පිටු අංකය**


| | | |
|---|---|---|
| 01 | 2016 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 01 – 04 |
| 02 | ආයතනික තොරතුරු | 05 – 06 |
| 03 | මානව සම්පත් පිරිස් බලය | 07 |
| 04 | ආයතනයේ සභාපතිතුමාගේ වාර්තාව | 08 |
| 05 | 2012සිට 2016 දක්වා වසර 5ක් සඳහා මුල්‍ය තත්ව ප්‍රකාශනය | 09 |
| 06 | 2012සිට 2016 දක්වා වසර 5ක් සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය | 10 |
| 07 | විගණන කමිටුවේ වාර්තාව - 2016 | 11 |
| 08 | විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව - 2016 | 12 – 25 |
| 09 | 2016.12.31ට ඒකාබද්ධ මුල්‍ය තත්ව ප්‍රකාශනය | 26 |
| 10 | 2016.12.31න් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශනය | 27 |
| 11 | 2016.12.31ට ඒකාබද්ධ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය | 28 |
| 12 | 2016.12.31ට ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 29 |
| 13 | 2016.12.31න් අවසන් වර්ෂයේ ඒකාබද්ධ මුල්‍ය වාර්තා සඳහා ගිණුම්කරණ සටහන් හා ප්‍රතිපත්ති | 30 – 39 |
| 14 | 2016.12.31න් අවසන් වර්ෂයේ ඒකාබද්ධ ගිණුම්කරණ සටහන් සඳහා සවිස්තරාත්මක සටහන් | 40 – 42 |
| 15 | 2016 වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීම් සටහන් | 43 – 44 |
| 16 | 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම් | 45 – 50 |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## 2016 වර්ෂය සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

**1.0 පසුබිම**

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි. ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම "ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව" ලෙස සංශෝධනය කරන ලදි.

කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අප සංස්ථාව 1985 පෙබරවාරි 01වන දින සිට පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත පවරා ගන්නා ලදි. ඉන් පසු 1997 ජුනි 19 වන දින සිට 2010 අප්‍රේල් මාසය දක්වා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී ඉන් අනතුරුව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා 2015 පෙබරවාරි මාසය දක්වා එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. වර්තමානය වන විට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

### 2.0 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය

**දැක්ම**

"ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන පහසුකම් සැපයීම සහ එහි පුරෝගාමියා වශයෙන් මගපෙන්වීම් කිරීම"

**මෙහෙවර**

"ගුණාත්මකභාවින් යුතු සිමෙන්ති සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන රටේ පවතින අවශ්‍යතාවයට සරිලන පරිදි සැපයීම"

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් සංස්ථාවේ කාර්යන් හා පරමාර්ථ ලෙස පහත දෑ ප්‍රකාශයට පත් කර ඇත.

- සිමෙන්ති නිෂ්පාදනය හා විකිණීම
- සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට් වලින් නිෂ්පාදනය කරනු ලබන දුරකථන සහ විදුලි පණිවුඩ හුවමාරු කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය ආදීය නිපදවීම හා අලෙවි කිරීම
- ඕනෑම පුද්ගලයෙකුට විදුලි බලය තොග වශයෙන් සැපයීම
- එසේම, 1964 මැයි 11 දිනැති අංක 14033 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් 1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද "සිමෙන්ති නිෂ්පාදනය හා බෙදාහැරීම" වෙනුවට " සිමෙන්ති නිෂ්පාදනය, ආනයනය කිරීම හා විකිණීම" ලෙස ඇතුලත් කරන ලද.

**ප්‍රධාන පරමාර්ථ**

සංස්ථාවේ ප්‍රධාන පරමාර්ථය වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම වේ.

එසේම, සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමද සංස්ථාවේ අරමුණු අතර වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වල රු.1,083,618,910/-ක් 1981දී ආයෝජනය කරන ලද අතර එහි කොටස් ප්‍රාග්ධනයෙන් 62.45%ක හිමිකාරීත්වය දරනු ලැබේ. කොටසක සම මිල රු.10/-ක් වේ. 2009 හා 2010 වර්ෂයන්හිදී සැලකිය යුතු ලෙස මෙම කොටසක මිල උතුරු පළාතේ පැවති අර්බුධකාරී තත්වය පහව යාම හේතුවෙන් රු.34.75ක් දක්වා ඉහළ යන ලදී. 2011 වර්ෂයේදී මෙම කොටසක වටිනාකම රු.26.20ක් දක්වා පහත වැටිණි. 2015 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී එහි කොටසක වෙළඳ පොළ අගය රු.8.20ක් වූ අතර දෙසැම්බර් මාසයේදී එහි අගය රු.7.90ක් විය. මෙම ආයෝජනයට අදාල ප්‍රතිලාභ මෙතෙක් සංස්ථාවට ලැබී නොමැත. 2010 අප්‍රේල් මාසයේ සිට 2016 පෙබරවාරි 25 දක්වා සංස්ථාව හා සමාගම එකම අධ්‍යක්ෂ මණ්ඩලයක පාලනය හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. මේ වන විට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා සිමෙන්ති සමාගම අධ්‍යක්ෂ මණ්ඩල දෙකක් යටතේ වෙන වෙනම ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, සීමාසහිත ලෆාර්ජ් මහවැලි මෙරීන් සිමෙන්ති සමාගමේ කොටසක අගය රු. 10/-ක් වූ කොටස් 320,000ක ආයොජනයක් සිදු කර ඇති අතර 1995 දෙසැම්බර් 31 දින එම කොටස් දෙකකට එකක් ලෙස වූ ප්‍රසාද කොටස් නිකුතුවෙන් පසු එම සමාගමේ මුළු කොටස් හිමිකාරීත්වය 480,000ක් විය. එය මුළු කොටස් හිමිකාරීත්වයෙන් 10%ක් වේ.මෙම ආයොජනයට අදාලව 1999දක්වා ප්‍රතිලාභ සංස්ථාවට හිමිවුනි. නැවත 2014 වර්ෂයට අදාලව රු.1,728,000/-ක් ලාභාංශ වශයෙන් 2015 වර්ෂයේදී හිමි විය.

## 3.0 වර්තමාන තත්වය

සංස්ථාව සතුව තිබූ පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාව හා රුහුණු සිමෙන්ති කර්මාන්තශාලාව ජනතාකරණයට භාජනය වීමත්, මට්ටක්කුලියේ පිහිටා තිබූ කඩදාසි මළු ඒකකයේ අයිතිය මහාභාණ්ඩාගාරයට මාරු කිරීම නිසාත්, දැනට සංස්ථාව සතු වනුයේ  කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව පමණි. එම කර්මාන්තශාලාවද උතුරේ පැවති යුධමය වාතාවරණය හේතුවෙන් 1990 ජුනි මස සිට වසා දමා ඇති අතර එම භූමිය මේ වන විටත් ශ්‍රී ලංකා යුධ හමුදාව යටතේ පවතී.

සේවකයින්ට අදාළ වැටුප් හා වේතන ගෙවීම සම්බන්ධව විශාල අර්බුධයකට සංස්ථාව මුහුණ දුන් අතර 2001 මාර්තු මාසය දක්වා කන්කසන්තුරේ සිමෙන්ති කම්හලේ සේවයේ නියුතු වූ සේවකයින්හට වැටුප් ගෙවීම් මහා භාණ්ඩාගාරයෙන් සිදුකරන ලදී. ඉන් පසුව 2003 හා 2005 වර්ෂයන්හිදී මහා භාණ්ඩාගාරය විසින් ස්වෙච්ඡා වන්දි යොජනා ක්‍රමයක් හඳුන්වා දුන් අතර සේවකයින් 173ක් හා 21ක් එම වර්ෂ වලදී විශ්‍රාම යන ලදී.ඊට පිළිවෙලින් රු මිලියන 49.18ක් හා 8.51ක් වන්දි වශයෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලදී. 2016 වර්ෂයේදීද මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වාදෙනු ලැබූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ සේවකයින් 36 දෙනෙකු 2016.07.31 දිනට විශ්‍රාම යන ලදි. ඊට අදාළව රු මිලියන 31.94ක් මහා භාණ්ඩාගාරය විසින් වන්දි හා විශ්‍රාම පාරිතෝෂිත ගෙවීම් සඳහා ලබා දෙන ලදි.

සිමෙන්ති නිෂ්පාදන කටයුතු නවතා දමා ඇති බැවින් සංස්ථාව විසින් 2008 වර්ෂයේ සිට සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරත වූ අතර 1997 වර්ෂයේ සිට කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීමේ නිරත විය.

(අ) සිමෙන්ති ආනයනය හා අලෙවිය :

අවම මිලකට ඉහළ ගුණත්වයෙන් යුතු සිමෙන්ති අවසන් පාරිභොගිකයා වෙත සැපයීම සඳහා 2008 වර්ෂයේ සිට සිමෙන්ති ආනයනය කර "කන්කේසන්" වෙළඳ නාමය යටතේ අලෙවි කිරීම සිදු කරන ලදි.

2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සිමෙන්ති මෙට්‍රික් ටොන් 219,559ක් පාකිස්ථානයේ ඩී.ජී.කාන් නැමැති ආයතනයෙන් ආනයනය කර ඇත.

එසේම 2013 ,2014 ,2015 හා 2016 යන වර්ෂ වලදී පිළිවෙලින් සිමෙන්ති මෙට්‍රික් ටොන් 20,300ක්, 18,900 ක්, 1,540ක් හා මෙට්‍රික් ටොන් 3,815ක් ලෙස ආනයනය කර ඇත.

**සිමෙන්ති අලෙවිය**

| වර්ෂය | 2016 | 2015 |
|---|---|---|
| ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | 4,002 | 2,780 |
| **වටිනාකම (රු.)** | **60,150,810** | **37,872,483** |

(ආ) **කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීම :**

කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම 1997 ඔක්තෝබර් මාසයේදී සංස්ථාව විසින් උරුම්පිරායි ප්‍රදේශයේ ආරම්භ කර ඇත. මෙමගින් ප්‍රධාන වශයෙන් ලංකා විදුලි බල මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතන වලට කොන්ක්‍රීට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයෙහි නිරත වී ඇත.

2009 වර්ෂයේදී කොන්ක්‍රීට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයට අමතරව කොන්ක්‍රීට් ගල්, තලාංද පදිකා වේදිකා ඇතුරුම්, කම්බි කණු යනාදි නිෂ්පාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, යාපනය විශ්වවිද්‍යාලය සහ සාමාන්‍ය ජනතාව වෙත අලෙවි කිරීම ආරම්භ කරන ලදි.

2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන 16,431ක් සිදු කර ඇත.

එසේම 2013 හා 2014 යන වර්ෂ වලදී පිළිවෙලින් කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන 2,003ක්, 1,674 ක් සිදු කර ඇත. 2015 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 191ක්, පන්තල් කණු 832ක් හා කොන්ක්‍රීට් ගල් 71,771ක් නිෂ්පාදනය කර ඇත. එසේම, 2016 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 168ක්, වැටවල් සඳහා වු කණු 224ක්, ආර්.සී.කණු 95ක් හා කොන්ක්‍රීට් ගල් 30,122ක් නිෂ්පාදනය කර ඇත.

**කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය**

| වර්ෂය | 2016 | 2015 |
|---|---|---|
| කොන්ක්‍රීට් කණු | 304 | - |
| වැටවල් සඳහා වු කණු | 253 | 391 |
| ආර්.සී.කණු | 169 | 419 |
| කොන්ක්‍රීට් ගල් | 46,907 | 54,805 |
| **වටිනාකම (රු.මිලියන)** | **4.07** | **2.69** |

චක්‍ර ලේඛ අංක 02/2016ට අනුව ක්‍රියාත්මක වු ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ කොන්ක්‍රීට් ආශිත නිෂ්පාදන අංගනයේ සේවයේ නියුතුව සිටි සේවකයින් 28 දෙනෙකු හා ප්‍රධාන ශාඛාවේ සේවයේ නියුතුව සිටි සේවකයින් 10 දෙනෙකු 2016.07.31දින සිට විශ්‍රාම යන ලදි.

දැනට කොන්ක්‍රීට් ආශිත නිෂ්පාදන අංගනයේ එක් ස්ථිර සේවකයෙකු හා දිනක වැටුප පදනම් කරගනිමින් සේවයේ නියුතු එක් සේවකයෙකු ලෙස සේවකයන් 02ක් සේවයේ නියුතු වේ.

එසේම, ප්‍රධාන කාර්යාලයේ සේවකයන් 13න් දෙනෙකු සේවයේ නියුතු වේ.

**(ඇ) ආයතනයේ කාර්ය්‍යසාධනය ඉහළ නැංවීම පිළිබඳ මධ්‍යකාලීන ක්‍රියාමාර්ග :**

සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වේ. ඒ තුලින් ස්ථායී හා කාර්ය්‍යක්ෂම මට්ටමකට ගෙන ඒමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා එහි පරිපාලිත සමාගම වන ලංකා සිමෙන්ති සමාගම ප්‍රතිව්‍යුහගත කල යුතු ආයතන ලෙස හඳුනාගෙන කටයුතු සිදු වෙමින් පවති.

2016 වර්ෂයේ පෙබරවාරි මස සිට මෙම ආයතන දෙක වෙන වෙනම වූ අධ්‍යක්ෂ මණ්ඩල යටතේ කළමණාකරණය වේ.

## 4.0 ලාභදායීත්වය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව , 2011 වර්ෂයේදී රු.මිලියන 2.6ක ලාභයක් උපයා ඇත. 2012, 2013 හා 2014 වර්ෂ වලදී පිළිවෙළින් රු. මිලියන 75ක්, රු. මිලියන 424ක් හා රු. මිලියන 13ක් ලෙස අලාභ දරා ඇත.

2015 වර්ෂයේදී විස්තීරණ වියදම් වලට පෙර ප්‍රකාශිත ගණකාධිකරණ ලාභය රු.4,344,849/-කි.

2016 වර්ෂයේ මුළු ඉපැයීම් රු.64,220,735/-කි. එය පෙර වසර හා සසඳන විට 58.29%ක වර්ධනයක් අත්පත් කරගෙන ඇත. මෙම වසරේ බදු පෙර ලාභය රු.32,070,027/-ක් වන අතර බදු පසු ලාභය රු. 31,700,843/-කි.

## 5.0 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අනාගත කාර්යභාරය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතින එකම සිමෙන්ති නිෂ්පාදන කර්මාන්තශාලාව කන්කසන්තුරේ කර්මාන්තශාලාව වන අතර යුධමය වාතාවරණය හේතුවෙන් එය 1990 ජුනි මස වසාදැමීමෙන් පසු මේ වන තුරු සිමෙන්ති නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොමැත. එසේම එහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීම පිළිබඳ පුරෝකථනයන්ද සිදුකල නොහැක. නමුත්, නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට අදාල වාර්තා සකස් කර අදාල ආයතන වෙත භාර දී ඇත.

කෙසේ නමුත් මෙම කන්කසන්තුරේ කර්මාන්තශාලාව සහිත භූමිය නැවත සිමෙන්ති සංස්ථාවට භාරදෙන ලෙස ඉල්ලීම් කර තිබුනද වර්තමානය වන විටත් එය භාර දීමට ශ්‍රී ලංකා යුධ හමුදාව කටයුතු කර නොමැත. මෙම භූමිය සංස්ථාවට මුදා හැරීමෙන් අනතුරුව ඊට යෝග්‍ය සංවර්ධන කටයුත්තක් ආරම්භ කල හැකිවේ.

කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශයේදී 2016.10.20වන දින පැවති “2016.07.31 දින ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ ආයතන වල ඉදිරි කටයුතු පිළිබඳ” රැස්වීමේදී ගනු ලැබූ තීරණ 2016.10.27 දිනැති අංක MIN/R/07/06/07 දරණ ලිපිය මඟින් දැනුවත් කල අතර ඒ අනුව අප සංස්ථාව සතු කොල්ලුපිටිය,මන්නාරම, පුත්තලම හා කන්කසන්තුරේ පිහිටා ඇති ඉඩම් සඳහා යෝග්‍ය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

එම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ජනිත වන ආදායම් මනා ලෙස කළමණාකරණය කිරීමටත්, ඒ තුලින් සංස්ථාවේ මූල්‍ය තත්වය ශක්තිමත් මට්ටමකට ගෙන ඒමට හා සංස්ථාව ස්ථාවර මට්ටමකට ගෙන ඒමටත් උත්සාහ කරනු ලැබේ.

## 6.0 සේවය ඇගයීම

2016 වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කටයුතු සඳහා ලබාදුන් මගපෙන්වීම් සම්බන්ධව කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා හට අධ්‍යක්ෂ මණ්ඩලයේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටින අතර සංස්ථාවට ලබාදුන් සහයෝගය වෙනුවෙන් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ, ප්‍රමිත ආයතනයේ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, රාජ්‍ය බැංකුවල, අනෙකුත් රජයේ ආයතන වල හා සිමෙන්ති නිෂ්පාදන හා අලෙවි කටයුතුවල නියුතු ආයතන වල සේවයේ නියුතු සියලු නිලධාරීන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

එසේම**,** ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සේවයේ නියුතු සේවකයින්හටද අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව පිළිබඳ තොරතුරු

## ***ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව***

**ප්‍රධාන කාර්යාලය**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

**දුරකථන අංක** : 0112 440 201 , 0112 440 203 **හා** 0112 440 205

**ෆැක්ස් අංක** : 0112 448 866

**සිමෙන්ති කර්මාන්තශාලාව**

කන්කේසන් සිමෙන්ති කර්මාන්තශාලාව, කන්කසන්තුරේ.

**කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අංගනය**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, උරුම්පිරායි, යාපනය.

**දුරකථන අංක** : 0213 215 340

**බැංකුකරුවෝ**

ලංකා බැංකුව, මහජන බැංකුව

**විගණකවරු**

විගණකාධිපති දෙපාර්තමේන්තුව, අංක.306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

## ***පරිපාලිත සමාගම - ලංකා සිමෙන්ති සමාගම***

**ප්‍රධාන කාර්යාලය**

ලංකා සිමෙන්ති සමාගම, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

**දුරකථන අංක** : 0112 447 746, 0112 399 243

**ෆැක්ස් අංක** : 0112 447 541

**සිමෙන්ති කර්මාන්තශාලාව**

සිමෙන්ති කර්මාන්තශාලාව, කිරිමලේ පාර, කන්කසන්තුරේ.

**සිමෙන්ති ගබඩාව**

නො.472, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 02.

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**2016 වර්ෂයේ සිට පහත දැක්වෙන අධ්‍යක්ෂවරුන් කළමණාකරණ මණ්ඩලයේ කටයුතු කර ඇත.**

| | | | | |
|---|---|---|---|---|
| 01. හුසේන් අහමඩ් බහිලා මහතා | සභාපති | 2015.02.13 | සිට | 2018.06.25 |
| 02. රියාස් එස්. සාලි | සභාපති | 2018.06.25 | සිට | |
| 03. එස්. අබිඩීන් එහියා මහතා | කළමණාකරණ අධ්‍යක්ෂ | 2016.02.16 | සිට | |
| 04. ඩබ්.ඩී.ජානක මහතා | අධ්‍යක්ෂ | 2015.02.25 | සිට | |
| 05. එම්.එස්.එම්.කබීර් මහතා | අධ්‍යක්ෂ | 2015.03.18 | සිට | |
| 06. එන්.එම්.මුනාවර් මහතා | අධ්‍යක්ෂ | 2015.03.31 | සිට | |
| 07. ඒ.රෂීක් මහතා | අධ්‍යක්ෂ | 2015.04.30 | සිට | |
| 08. ටී.ඕ.ආර්.වනිගරත්න මහතා | නිරීක්ෂක | 2015.03.10 | සිට | |
| 09. ඩී.එස්.කොස්තා මහත්මිය | නිරීක්ෂක | 2015.10.30 | සිට | |

**ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුව**

| | |
|---|---|
| 01. එම්.ජී.ඒ.ටී.ආර්.ජයතිලක | ගණකාධිකාරී |
| 02. ඊ.එස්.චාන්දනී | පිරිස් නිලධාරී |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2016.12.31 දිනට මානව සම්පත් පිරිස් බලය

| වර්ගය | ජ්‍යෙෂ්ඨ කළමණාකරන | මධ්‍ය කළමණාකරන | කණිෂ්ඨ කළමණාකරන | කළමණාකරන සහකාර | ප්‍රථමික මට්ටම | එකතුව |
|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | - | 01 | 01 | 04 | 07 | 13 |
| කොන්ක්‍රීට් අංගනය | - | - | - | - | 01 | 01 |
| **එකතුව** | **-** | **01** | **01** | **04** | **08** | **14** |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සභාපතිගේ වාර්තාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි.

මෙම සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය විසින් සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරත වේ. 2016.07.31 දින සිට බලපාන පරිදි ස්වේච්ඡා වන්දි යොජනා ක්‍රමය ක්‍රියාත්මක වූ අතර කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අංගනය වසා දැමීමට තීරණය කර ඇත.

චක්‍ර ලේඛ අංක 02/2016ට අනුව ක්‍රියාත්මක වූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය සඳහා මහාභාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රතිපාදන ලද අතර එහිදී සේවකයින් 36 දෙනෙකු 2016.07.31දින සිට විශ්‍රාම යන ලදි.

මෙම වාතාවරණය තුල වුවද 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව රු.මිලියන 64.22ක ආදායමක් හා විස්තීරණ වියදම් වලට පෙර ගණකාධිකරණ ලාභය ලෙස රු. මිලියන 31.07ක් වාර්තා කර ඇත.

එසේම අපගේ පරිපාලිත සමාගම වන ලංකා සිමෙන්ති සමාගම හා එක්ව මෙම වර්ෂයේ ඒකාබද්ධ ආදායම ලෙස රු.මිලියන 174.08ක් හා විස්තීරණ වියදම් වලට පෙර ගණකාධිකරණ ඒකාබද්ධ ලාභය ලෙස රු. මිලියන 21.02ක් වාර්තා කර ඇත.

2016 අගොස්තු 01 වන දින සිට සේවකයින් 14 දෙනෙකු සමග ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි. නව වර්ෂයේදී සංස්ථාව සතු ඉඩම් හා අනෙකුත් වත්කම් සඳහා නව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම පිළිබද බලාපොරොත්තු සහිතව සිටින අතර එම ව්‍යාපෘති තුලින් දිගු කාලීන වාසී සංස්ථාවට අත්පත් කරගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

කෙසේ නමුත්, ව්‍යාපාරික කටයුතු වල නිරත වීම තුලින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වඩාත් ස්ථායී හා කර්යක්ෂම තත්වයට පත් කීරීමට කටයුතු කරනු ලැබේ.

***අත්සන් කලේ,***

**හුසෙන් අහමඩ් බහිලා,**
**සභාපති,**
**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ**

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

# මූල්‍ය තත්ව ප්‍රකාශනය
# 2012 වසරේ සිට 2016 දක්වා දෙසැම්බර් 31 දිනට

| | 2016 | පුන ප්‍රකාශය කරන ලද 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | **රු.'000** | **රු.'000** | **රු.'000** | **රු.'000** | **රු.'000** |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල පිරියත උපකරණ | 3,887 | 4,173 | 779,317 | 779,486 | 608,596 |
| දීර්ඝ කාලීනව ලැබිය යුතු දෑ | 773,700 | 773,700 | - | - | - |
| පරිපාලිත සමාගම්වල ආයෝජනයන් | - | 757,224 | 757,224 | 757,223 | 757,223 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 624,063 | 862,458 | 721,589 | 678,244 | 1,090,019 |
| | 5,162 | 35,469 | 33,428 | 31,247 | 28,280 |
| | **1,406,812** | **2,433,024** | **2,291,558** | **2,246,200** | **2,484,119** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය | 3,099 | 8,594 | 18,933 | 39,024 | 19,739 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 89,212 | 80,551 | 96,247 | 89,549 | 84,242 |
| ඉදිරියට කල ගෙවීම් | - | - | - | 261 | 244 |
| මුදල් හා මුදල් සමාන දෑ | 13,687 | 8,743 | 2,076 | 3,592 | 4,201 |
| | **105,998** | **97,838** | **117,256** | **132,426** | **108,426** |
| **මුළු වත්කම්** | **1,512,810** | **2,530,863** | **2,408,814** | **2,378,626** | **2,592,545** |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| **හිමිකම්** | | | | | |
| කොටස් ප්‍රාග්ධනය | 966,971 | 966,971 | 966,971 | 966,971 | 966,972 |
| පොදු සංචිත | 9,997 | 9,997 | 9,997 | 9,997 | 9,997 |
| ප්‍රත්‍යාගණන සංචිත | 536,119 | 536,119 | 713,619 | 713,619 | 536,119 |
| රඳවාගත් ඉපැයුම් | (210,289) | 515,234 | 333,315 | (66,820) | 357,783 |
| විකිණීම සඳහා වන දැඟි සංචිත | (465,956) | (227,560) | (368,430) | - | - |
| | **836,842** | **1,800,761** | **1,655,474** | **1,623,767** | **1,870,871** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| දිගු කාලීන වගකීම් | 492,426 | 500,426 | 519,303 | 543,914 | 578,543 |
| විශ්‍රාම පාරිතෝෂිත අරමුදල | 3,298 | 18,697 | 19,394 | 18,290 | 17,952 |
| | **495,724** | **519,123** | **538,698** | **562,204** | **596,495** |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 46,502 | 81,305 | 93,227 | 85,224 | 96,195 |
| පොලී ගෙවිය යුතු වගකීම් | 97,793 | 101,020 | 68,515 | 79,015 | 2,068 |
| බැංකුවට ගෙවිය යුතු වගකීම් | 21,768 | - | - | - | - |
| මුදල් හා මුදල් සමාන දෑ | 14,181 | 28,653 | 52,900 | 28,416 | 26,916 |
| | **180,244** | **210,978** | **214,642** | **192,655** | **125,179** |
| **හිමිකම් හා වගකීම්** | **1,512,810** | **2,530,863** | **2,408,814** | **2,378,626** | **2,592,545** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

**2012 වසරේ සිට 2016 දක්වා**

| | 2016 | පුන ප්‍රකාශය කරන ලද 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| ආදායම | 64,221 | 40,571 | 285,657 | 287,913 | 365,333 |
| විකුණුම් පිරිවැය | (66,525) | (50,781) | (280,878) | (272,178) | (374,016) |
| **දළ ලාභය/(අලාභය)** | **(2,304)** | **(10,211)** | **4,779** | **15,735** | **(8,683)** |
| වෙනත් ආදායම් | 91,542 | 60,043 | 34,233 | 34,885 | 32,751 |
| බෙදාහැරීම් වියදම් | (292) | (1,198) | (2,951) | (6,670) | (4,906) |
| පරිපාලන වියදම් | (41,172) | (30,461) | (29,211) | (448,079) | (78,899) |
| මූල්‍ය වියදම් | (15,704) | (15,334) | (20,642) | (20,474) | (15,362) |
| **විස්තීරණ ආදායම් / (වියදම්) වලට පෙර ලාභය/(අලාභය)** | **32,070** | **2,839** | **(13,793)** | **(424,603)** | **(75,099)** |
| **විස්තීරණ ආදායම් / (වියදම්)** | | | | | |
| මූල්‍ය වත්කම් මත වූ ලාභය/(අලාභය) | (995,620) | 140,870 | 43,345 | - | - |
| **බදු පෙර ලාභය/(අලාභය)** | **(963,550)** | **143,709** | **(29,552)** | **(424,603)** | **(75,099)** |
| බදු පිරිවැය | (369) | (255) | - | - | - |
| **බදු පසු ලාභය/(අලාභය)** | **(963,181)** | **143,454** | **(29,552)** | **(424,603)** | **(75,099)** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## විගණන කමිටුවේ වාර්තාව - 2016

සංස්ථාවේ විගණන කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විතවේ. කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකතුමා හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතවරයෙකුද නිරීක්ෂකවරුන් ලෙස ඊට සහභාගි වේ.

විගණන කමිටුවේ සභාපති ලෙස ඩී.එස්.කොස්තා මහත්මිය කටයුතු කරනු ලබයි. එම්.එස්.එම්.කබීර් මහතා සහ එන්.එම් මුනාවර් මහතා කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරනු ලැබේ.

විගණන කමිටුවේ වගකීම් හා කාර්යභාරය පහත පරිදි වේ.
අ. වාර්ෂික වාර්තාවන්, ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට හා අනෙකුත් අදාල නීතිමය තත්වයන්ට අනුකූල වන ගෙස සකස්කර තිබේද යන්න් පිළිබදව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දීම.

ආ. අදාල නීති, රෙගුලාසි සහ අනුමත චක්‍රලේඛයන්ට අනුකූලව සංස්ථාව කටයුතු කර තිබේද සහ එසේ අනුකූල නොවන අවස්ථාවන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දී දැනුවත් කිරීම.

ඇ. අභ්‍යන්තර සහ බාහිර විගණන වාර්තා සහ පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරකසභාවේ උපදෙස් සලකා බැලීම හා ඒ පිළිබඳ කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට උපකරෙ කිරීම.

ඈ. අභ්‍යන්තර පාලන ක්‍රමයන් සංස්ථාවට හඳුන්වා දීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම.

සමාලොචිත වර්ෂයේ විගණන කමිටුව විසින් වෙන්ත් කාර්යයන් සමග පහත සඳහන් ක්‍රියාකාරකම් වලද යෙදුනි.

- විගණනය නොවූ මාසික මුල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණනය වූ වර්ෂයට අදාල මුල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණක වාර්තා පරික්ෂා කිරීම හා කළමණාකරණය විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම.
- ව්‍යවස්ථාපිත ගෙවීම් පිළිබඳ දැනුවත් කිරීම.

***අත්සන් කලේ,***

***එස්.එම්.පියතිස්ස,***
***සභාපති***
***විගණන කමිටුව***

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | විසිඑම්/ඒ/එස්එල්සිසි/ 37/2016/එෆ්ඒ | මබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2018 ජනවාරි 28 දින |

සභාපති,

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සහ එහි පරිපාලිත සමාගමක් වන සී/ස ලංකා සිමෙන්ති සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සහ එහි පරිපාලිත සමාගමක් වන සී/ස ලංකා සිමෙන්ති සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2017 ඔක්තෝම්බර් 11 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැළපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

--------------

2.1 මතය ව්‍යාචනය - සමූහය

--------------------------

මෙම වාර්තාවේ 2.2.1 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

මතය ව්‍යාචනය - සංස්ථාව

--------------------------

මෙම වාර්තවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 සමූහයේ අඛණ්ඩ පැවැත්ම

---

සංස්ථාවේ ප්‍රාග්ධනය රු මිලියන 967 ක් වූ අතර, සමුච්චිත අලාභය රු. මිලියන 676 ක් විය. සංස්ථාවේ පැවැත්මට බලපෑමක් ඇතිවී නැතත්, සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම දිගින් දිගටම අලාභ ලබා තිබීම හේතුවෙන් ඒකාබද්ධ ස්කන්ධය වෙනස්විමේ ප්‍රකාශනය අනුව රු.මිලියන 3,045 ක සමුච්චිත අලාභයක් ලබා තිබුණු අතර ප්‍රාග්ධනය රු.මිලියන 2,702 ක් විය. ඒ අනුව කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 112.7 ක් ඛාදනය වි ඇති බව නිරීක්ෂණය වූ අතර එම හේතුවෙන් භාණ්ඩාගාරයේ සහාය නොමැතිව සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

### 2.2.2 සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

---

ප්‍රමිතයේ 86 වගන්තිය අනුව ආයතනයේ අසම්භාව්‍ය බැරකම් පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථාව විසින් 2016 දෙසැම්බර් 31 දිනට උසාවියේ විභාග වෙමින් පවතින නඩු 15 ක් සම්බන්ධයෙන් ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

#### 2.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සිමෙන්ති විකුණුම් වට්නාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමේදී එකතුව රු.600,360 ක ජාතිය ගොඩනැගීමේ බදු ද ඇතුළත් දල විකුණුම් වට්නාකම සටහන් කිරීම නිසා වර්ෂයේ දල අලාභය එම වට්නාකමින් අඩුවි තිබුණි.

(ආ) සිමෙන්ති සංස්ථාවට අයත් පුත්තලම ප්‍රදේශයේ පිහිටි ඉඩමක් හොල්සිම් ලංකා සමාගමට කුලියට දී තිබූ අතර, කුලී ගිවිසුම් කාලය අදාල වර්ෂයේ මැයි සිට ඊළඟ වර්ෂයේ ජූනි මාසය දක්වා විය. ඒ අනුව 2015/2016 වර්ෂ සඳහා ලැබූ රු.121,000 කුලී ආදායම 2015 වර්ෂයේ ආදායමක් ලෙස මුදල් පදනමට ගිණුම් තැබීම නිසා 2016 වර්ෂයේ කුලී ආදායම

රු.50,416 ක් අඩුවෙන් සටහන් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා වූ රු.70,584 ක ලැබිය යුතු ආදායම් මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) පුත්තලම අරුවක්කාලු ඉඩමේ හුණුගල් නිධිය සම්බන්ධව තාක්ෂණික අධ්‍යයන කටයුතු සඳහා භූමියට ප්‍රවේශ වීමේ ගාස්තු ලෙස පෞද්ගලික ආයතනයකින් ලැබී තිබූ රු.321,900 ක වටිනාකමින් රු.31,900 ක් එකතු කළ අගය මත බදු සඳහා ලැබීම් වන අතර එම එකතු කළ අගය මත බදු ලැබීම්ද විවිධ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2012 වර්ෂයේ ගෙවූ ආර්ථික සේවා ගාස්තු මුදලින් ඉදිරියට ගෙන යා නොහැකි රු.1,065,027 ක මුදල රඳවාගත් ලාභ ගිණුමට හර කළ යුතු වුවද, සංස්ථාව විසින් එය සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හර කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2010 වර්ෂයේදී සංස්ථාව සතු තෙල් ටැංකි ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට බදු පදනම මත ලබාදී තිබුණි. ඒ අනුව 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සංස්ථාවට අයවිය යුතු මුළු බදු මුදල රු. මිලියන 84.6 ක් විය. එම ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කර නොතිබුණු අතර, එම ආදායම් 2016 වර්ෂය අවසාන වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි සංකීර්ණය සහ ඉඩමේ අයිතිය ලිඛිතව තහවුරුවී තිබුණද, 1989 වර්ෂයෙන් පසුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මෙම වත්කම් ඇතුළත් කර නොතිබුණි.

(උ) පුත්තලම දිස්ත්‍රික්කයේ පාලවිහි සංස්ථාව සතුව පවතින අක්කර 221 ක් වූ ඉඩමෙන් අක්කර 152 ක් පමණක් තක්සේරු කර ගිණුම්ගත කර තිබුණද, ඉතිරි අක්කර 69 තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------

ආයතනය විසින් පවත්වාගනු ලබන බැංකු ජංගම ගිණුමක් වෙනුවෙන් පරිගණක ආශ්‍රයෙන් පවත්වාගනු ලබන මුදල් පොත අනුව 2016 දෙසැම්බර් 31 දිනට රු.2,654,122 ක් ශේෂයක් පැවතියද අතින් ලියන ලද මුදල් පොත අනුව එම ශේෂය රු.1,106,032 ක් වූයෙන් රු.1,548,090 ක වෙනසක් නිරීක්ෂණය විය. 2008 වර්ෂයේ සිට පවතින එම වෙනස හඳුනාගෙන

නිරවුල් කිරීමට කටයුතු කිරීමකින් තොරව පරිගණකගත මුදල් පොතේ ශේෂය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි.

2.2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| බැංකු ණය | 56,293,352 | ණය ලිපිගොණු හා උපලේඛන |
| ලැබිය යුතු තැන්පත් | 859,437 | ශේෂ සනාථන ලිපි |

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ රු.89,212,053 ක් වූ අතර, එම ශේෂ තුළ වසර 1 සිට වසර 3 දක්වා රු.11,010,343 ක් සහ වසර 3 ඉක්ම වූ රු.57,988,878 ක ශේෂයන් විය. මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වෙළඳ ශේෂ රු.46,502,068 ක් වූ අතර, එම ශේෂ තුළ වසර 1 සිට වසර 3 දක්වා රු.13,180,262 ක් සහ වසර 3 ඉක්ම වූ රු.30,086,483 ක ශේෂයන් විය. එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් 2014 සහ 2015 වර්ෂ වලදී අවස්ථා 13 කදී මාස 02 කින් ගෙවීමේ පදනම මත සංස්ථාව සතු ඉඩම ඇපයට තබා කෙටිකාලීන ණය මුදලක් රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණි. එම ණය මුදල 2015 සැප්තැම්බර් 15 දින වන විට ගෙවා අවසන් කළ යුතු වුවද 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.56,293,352 ක් ගෙවිය යුතුව පැවතුණි.

(ඈ) සංස්ථාව විසින් ලබාගත් බැංකු ණය වෙනුවෙන් වාරික හා පොළිය නිසි පරිදි නොගෙවීම නිසා පොළී සඳහාද පොළී ගෙවීමට සංස්ථාවට සිදුවී තිබුණි. ඒ අනුව පූර්ව වර්ෂවල ලබාගත් බැංකු ණය සහ ඊට අදාළ පොළී මුදල් වල එකතුව රු.42,000,000 ක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත කෙටිකාලීන ණය ගිණුමකට මාරු කර තිබූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට එම ණය ගිණුමේ නොපියවූ ශේෂය රු.17,500,000 ක් විය.

(ඉ) අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව, අන්තර් ජාතික සමාගමකට ගෙවිය යුතු ණය මුදලක් පියවීම සඳහා රාජ්‍ය බැංකුවකින් 2012 වර්ෂයේදී රු.40,000,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. 2013 වර්ෂයේ සිට වර්ෂ 5 ක් තුළ සමාන වාරික 5 කින් එම ණය මුදල ගෙවා අවසන් කළ යුතු වුවද නිසි පරිදි වාරික මුදල් නොගෙවීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට එම මුළු ණය මුදලින් ගෙවිය යුතු මුළු ණය වටිනාකම රු.24,000,000 ක් විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 396 | බැංකු ජංගම ගිණුම් 02 කට අදාළ එකතුව රු.1,116,485 ක් වටිනා නිකුත් කර ඇතත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර චෙක්පත් අවලංගු කර තිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 4.2.6 වගන්තිය | කාර්යසාධන වාර්තා මාස තුනකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කළ යුතු අතර, කාර්තුව අවසන් වීමට දින 30 කට පෙර එම වාර්තාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | විවිධ කාර්යයන් සඳහා ලබාදෙන ලද එකතුව රු.1,388,569 ක අත්තිකාරම් මුදල්, හඳුනාගෙන පියවීමට කටයුතු කිරීමකින් තොරව තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි. |
| (ඈ) 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි සංකීර්ණයෙහි වටිනාකම රු.2,624,338 ක් වන ඉඩම්, ගොඩනැගිලි, ලී බඩු හා උපකරණ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.31,700,843 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.2,583,617 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.29,117,226 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දළ අලාභය රු.7,906,665 කින්, එනම් සියයට 77.4 කින් අඩුවී තිබීම සහ අනෙකුත් ආදායම් රු.31,498,348 කින්, එනම් සියයට 52.46 කින් වැඩිවී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛන්ඩව ශුද්ධ අලාභ ලබා නැවතත්, 2015 සහ 2016 වර්ෂයේදී පිළිවෙලින් රු.2,583,617 ක් සහ රු.31,700,843 ක ශුද්ධ ලාභ තත්ත්වයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු සංස්ථාවේ දායකත්වය, 2012 වර්ෂයේදී රු.26,165,135 ක ධන අගයක් වූ අතර, 2013 වර්ෂයේදී රු.338,370,664 ක ඍණ අගයක් ගෙන තිබුණි. 2014 සහ 2015 වර්ෂවලදී දායකත්වය ධන අගයක්ව පැවති අතර, 2016 දී රු.70,978,162 ක ධන අගයක්ව පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1959 ජනවාරි 2 දිනැති අංක 11634 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව සිමෙන්ති නිෂ්පාදනය, ආනයනය කිරීම හා අලෙවි කිරීම, සිමෙන්තියෙන් නිෂ්පාදිත භාණ්ඩ අලෙවිය හෝ සිමෙන්ති කොන්ක්‍රීට් ඇතුළත් දුරකථන සහ විදුලි රැහැන් කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය කිරීම, විද්‍යුත් බලශක්තිය තොග වශයෙන් සැපයීම සංස්ථාවේ ප්‍රධාන අරමුණු විය.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිමෙන්ති නිෂ්පාදනය කර අලෙවි කිරීම සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කිරීම සංස්ථාවේ ප්‍රධාන අරමුණු වුවත්, පසුගිය යුධමය වාතාවරණය තුළ කන්කසන්තුරේ සිමෙන්ති නිෂ්පාදනය නතර වීමත් සමඟ, වර්තමානය වන විට සිමෙන්ති මලු ආනයනය කර අලෙවි කිරීම සහ කොන්ක්‍රීට් නිෂ්පාදන අලෙවිය දක්වා ආයතනයේ මූලික කාර්යය සීමා වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ සංයුක්ත සලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සමඟ කාර්යසාධන වාර්තාව සැසඳීමේදී සත්‍ය ක්‍රියාකාරීත්වය සන්සන්දනය කළ හැකි පරිදි එම වාර්තාව පිළියෙල කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළදී රු.107,858,978 ක් වටිනා සිමෙන්ති අලෙවි කිරීමට සැලසුම් කර තිබුණද, ආයතනයේ මූල්‍ය දුෂ්කරතා වලට මුහුණ දීම නිසා කාර්යසාධන වාර්තාව අනුව අලෙවි කර තිබුණේ රු.63,030,000 ක් වටිනා සිමෙන්ති පමණි. ඒ අනුව ලඟා කරගත් කාර්යසාධනය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 41.56 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොන්ක්‍රීට් කණු සහ බ්ලොක් ගල් නිෂ්පාදනය කර අලෙවි කිරීමෙන් රු.2,408,000 ක ආදායමක් උපයා තිබුණද, ක්‍රියාකාරී සැලැස්මේ අදාළ ඉලක්ක සටහන් කර නොතිබුණි.

(ඉ) සංස්ථාව පිහිටුවීමේ මූලික අරමුණ සිමෙන්ති නිෂ්පාදනය කර අලෙවි කිරීම වුවත්, 2016 ඔක්තෝබර් 20 දිනැති අංක PE/RES/VRS – 1 – 2016 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසුව රටේ ක්ලින්කර් නිධියන්හි භාරකාරත්වය සංස්ථාවට පවරා තිබුණු හෙයින් සංස්ථාවේ ඉතිරි සේවකයින් 14 දෙනා යොදවාගෙන බදු කුළිය නිර්ණය, කන්කසන්තුරේ ඇතුළු ඉතිරි ඉඩම් සඳහා බදුදීම සහ බදු ගිවිසුම් යාවත්කාලීන කිරීම ආදී කටයුතු සිදුකර එම ආදායමෙන් සේවක පාරිශ්‍රමික

ගෙවීමෙන් අනතුරුව ඉතිරි මුදල් රජයට ප්‍රේෂණය කිරීම යන කාර්ය සංස්ථාව වෙත පවරා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදන අලෙවිය තුළින් 2016 වර්ෂය තුළ එකතුව රු.2,304,013 ක දළ අලාභයක් ලබා තිබුණි.

(ආ) 1967 ජූලි 12 දිනැති අංක 14756/7 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය සහ අංක 288 දරන ඔප්පුව මගින් කොල්ලුපිටියේ පිහිටි පර්චස් 89.9 ක ඉඩම සංස්ථාවට හිමිව තිබුණි. 2008 වර්ෂයේදී ලංකා බැංකුවෙන් රු.172,000,000 ක උපරිම ණය සීමාවක් යටතේ ණය ලබා ගැනීම සඳහා මෙම ඉඩම බැංකුවට උකස් කර 2016 දෙසැම්බර් 31 දිනට රු.97,793,352 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. ඒ සඳහා ගෙවිය යුතු පොළිය රු.21,767,910 ක් වූ අතර, බැංකුවට ගෙවිය යුතු මුළු ණය හා පොළී මුදල රු.119,561,262 ක් විය. මේ අනුව මූල්‍ය දුෂ්කරතා මත සංස්ථාව ඉඩම නිරවුල් කර ගැනීමේ අවධානමක් පැවතුණි.

(ඇ) සංස්ථාව විසින් රු.1,200,000 කට මිලදී ගන්නා ලද ගාල්ල උණවටුන කැස්බෑපාන පිහිටි අක්කර 06 ක ඉඩම ආයතනයේ අවසරයකින් තොරව ගාල්ල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සුනාමියෙන් විපතට පත්වූවන් නැවත පදිංචි කිරීම සඳහා භාවිතා කර තිබුණි. එම ඉඩම සඳහා වන්දි මුදල් ලබාගැනීම සඳහා ගාල්ල දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණි.

(ඈ) සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි සංකීර්ණය ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට බද්දු දුන් බව ප්‍රකාශ කළද, 2016 වර්ෂය හා ඉදිරි වර්ෂ සඳහා එම සමාගම හෝ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ කිසිදු ලිඛිත ගිවිසුමකට සංස්ථාව එළඹී නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කන්කසන්තුරේ පිහිටි සිමෙන්ති කර්මාන්තශාලාව සහ ගොඩනැගිලි සංකීර්ණය පිහිටි භූමිය අක්කර 741 ක් වූ අතර, එයින් අක්කර 297 ක් ගැසට් නිවේදනයක් මගින් සංස්ථාව වෙත පවරා තිබුණි.ඉතිරි අක්කර 444 ක ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර නොතිබූ අතර, හිමිකාරිත්වය පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලද අතර, මෙම මෙම කර්මාන්තශාලාව, ගොඩනැගිලි හා ඉඩම් අධි ආරක්ෂිත කලාපයේ යුධ හමුදාව භාරයේ දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රිය වත්කමක් ලෙස පැවතුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ පාලච්චි සංස්ථාව සතුව පවතින අක්කර 221 ක් වූ ඉඩමෙන් අක්කර 209 ක් ඵලාදායී කාර්යයක යෙදවීමට කළමනාකරණය පියවර ගෙන නොතිබුණි.

## 4.4 ආර්ථික නොවූ ගණුදෙනු

සංස්ථාව විසින් 1981 වර්ෂයේ සිට සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වල රු.1,083,618,910 ක් ආයෝජනය කර තිබුණද, 2016 වසර දක්වා කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාවට සමාගමෙන් ලබාදී නොතිබුණි.

## 4.5 හඳුනා ගන්නා ලද පාඩු

2009 අංක 16 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත අනුව පිරිවැටුම කාර්තුවකට රු. මිලියන 50 ක් හෝ ඊට වැඩි නම් පමණක් ආර්ථික සේවා ගාස්තු සඳහා බැඳීමක් ඇති වේ. 2013 හා 2014 වර්ෂ දෙක වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.54,191,154 ක් පමණක් ලැබී තිබියදී එම ආදායම පදනම් කරගෙන රු.163,388 ක් ආර්ථික සේවා ගාස්තු ගෙවීම් කර තිබුණි. එම මුදල අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද 2016 වර්ෂයට අදාළ රු.27,399,370 ක කුලී මුදල පදනම් කරගෙන රු.129,211 ක් ආර්ථික සේවා ගාස්තු ලෙස වෙන් කර තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ 2016 ජනවාරි 01 දිනට අනුමත කාර්ය මණ්ඩලය 76 ක් විය. 2016 ජූලි 31 දින ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් මගින් සේවකයින් 36 දෙනෙකු විශ්‍රාම ගොස් තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 14 දෙනෙකුට සීමාවී තිබුණි. ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසු සංස්ථාව වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය අනුමත කරවාගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සංස්ථාවේ 2016 වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2017 ජූනි 20 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය අනුව සංයුක්ත සැලැස්මේ ඇතුළත් විය යුතු ආයතනයේ සංවිධාන සැලැස්ම, මානව සම්පත් හා කළමනාකරණ දක්ෂතා සහ පසුගිය වර්ෂ 03 ක මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය යන ප්‍රධාන කරුණු ඇතුළත් කර නොතිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන පිටපත් අයවැය ලේඛනය සමඟ රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහ භාණ්ඩාගාරය හා විගණකාධිපති වෙත එක් එක් මූල්‍ය වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15 ට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය අනුව, සැලසුම්ගත කාලපරිච්ඡේදය තුළදී සපුරාගත යුතු අරමුණු හා ඉලක්ක පිළිබඳව කළමනාකරුවන්ගේ වගකීම ක්‍රියාකාරී සැලැස්මේ පැහැදිලිව දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වන විට ආයතනයේ ප්‍රධාන අරමුණ, කිලෝ ග්‍රෑම් 50 පෝට්ලන්ඩ් සිමෙන්ති මළු ආනයනය කර බෙදාහැරීම ලෙස දක්වා තිබුණද, සංයුක්ත සැලැස්මේ සහ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර තිබූ ඉලක්කගත වටිනාකම් අතර රු.2,858,978 ක වෙනසක් පැවතුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

සංස්ථාවේ 2016 වර්ෂයේ පළමු අර්ධ වර්ෂය තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද එක් නිලධාරිනියක් පමණක් අනුයුක්ත කර තිබුණි. පළමු අර්ධ වර්ෂය තුළ විගණන විමසුම් නිකුත් කර නොතිබූ අතර, එම නිලධාරිනියද 2016 ජූලි සිට ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය මගින් විශ්‍රාම ගොස් තිබුණි. මෙම හේතුව මත 2016 දෙසැම්බර් 31 දින වන විට අභ්‍යන්තර විගණන අංශය සම්පූර්ණයෙන්ම අක්‍රියව පැවතුණි.

5.5 විගණන කමිටු

---------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය අනුව කැඳවුම්කරු ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක සමඟ අවම වශයෙන් මාස 03 කට වරක් විගණන කමිටුව බැගින් වර්ෂයක් තුළ විගණන කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත්, සංස්ථාව විසින් 2016 වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

5.6 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව 2016 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.7 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 08 ක අයවැයගත හා තත්‍ය වියදම්වල සියයට 43 සිට සියයට 971 දක්වා විචලනයන් පැවති අතර, අයවැය ඇස්තමේන්තු අනුමත කර ගැනීමකින් තොරව පුනරාවර්තන වැය විෂයයන් 11 ක් වෙනුවෙන් එකතුව රු.18,925,523 ක වියදම් දරා තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.8 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අවසාන විගණිත ගිණුම් සමඟ විගණන වාර්තා භාෂාත්‍රයෙන්ම පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා 2017 ජූලි දක්වා අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

5.9 නොවිසඳී ඇති විගණන ඡේද

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණය පදනම මත සිමෙන්ති විකිණීම සඳහා අළෙවි නියෝජිත ධූරය ප්‍රදානය කිරීමේදී ණය පදනම මත ලබාදෙන වටිනාකමට සරිලන ඇප බැඳුම්කරයක් ලබා නොගැනීම හා ණය ලබාදීමේදී සහ ණය එකතු කිරීමේදී කළමනාකරණය විසින් විධිමත් හා කාර්යක්ෂම ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකතුව රු.52,506,824 ක් වූ ණය ශේෂ අයකරගෙන නොතිබුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ, අරුවක්කාලු ප්‍රදේශයේ පිහිටි අක්කර 5352 ක් වූ හුණුගල් නිධිය 1995 වර්ෂයේදී සිමෙන්ති නිෂ්පාදනය සඳහා හුණුගල් කැණීම් කිරීමට පෞද්ගලික සමාගමකට වසර 50 ක කාලසීමාවකට බදු දී තිබුණි. බදු ගිවිසුම අනුව සමාලෝචිත වර්ෂයේදී අයකරගත යුතු වාර්ෂික කුලිය ඇ. ඩො. 202,804 කට සමාන රු.26,851,358 ක වටිනාකමක් විය. කෙසේ නමුත්, ඇතිකරගෙන තිබූ බදු ගිවිසුමේ වාර්ෂික බදු කුලිය සංශෝධනය කිරීම පිළිබඳ වගන්තියක් ඇතුළත් කර නොතිබීම හේතුවෙන් 2011 අගෝස්තු 16 දින පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙම බදු ගිවිසුම සංශෝධනය කිරීමට උපදෙස් ලබාදී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබූ අතර, මෙම ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමටද කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ආයතනයේ ලෙජර් ගිණුම්, පොත්පත් හා ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම. |
| | (ii) ආයතනය විසින් ප්‍රධාන ජර්නලයක් පවත්වා නොතිබීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | (i) වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම |
| | (ii) සමීක්ෂණ මණ්ඩල පත් කිරීම සහ සමීක්ෂණයන් කිරීම ප්‍රමාද කිරීම. |
| (ඇ) ගබඩා පාලනය | සිමෙන්ති තොග නඩත්තු කිරීම, ගබඩා කිරීම සහ තොග වාර්තා පවත්වා ගැනීම සම්බන්ධයෙන් නිසි අවධානය යොමු නොකිරීම. |

| | |
|---|---|
| (ඇ) අභ්‍යන්තර පාලනය | (i) අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීමටත්, ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කර පාලනයන් පවත්වා ගැනීමට කටයුතු නොකිරීම. |
| | (ii) අභ්‍යන්තර විගණන අංශයක් නොමැති වීම |
| (ඉ) ණයගැති හා ණය හිමි පාලනය | (i) හිඟ ණය ශේෂ අයකර නොගැනීම. |
| | (ii) ගෙවිය යුතු ශේෂ පියවීමට කටයුතු නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

මූල්‍ය තත්ව ප්‍රකාමූල්‍ය තත්ව ප්‍රකාශනය

**2016 දෙසැම්බර් 31දිනෙන් අවසන් දිනට**

| | | | පුනප්‍රකාශිත | | | |
|---|---|---|---|---|---|---|
| | | **2016** | **2015** | **2016** | **2015** | **2016** |
| **වත්කම්** | සටහන් | **ශ්‍රී.සි.ස.** | **ශ්‍රී.සි.ස.** | ඒකාබද්ධ | ඒකාබද්ධ | පරිපාලිතය |
| **ජංගම නොවන වත්කම්** | | රු. | රු. | රු. | රු. | රු. |
| දේපල පිරියත හා උපකරණ | | 3,886,969 | 4,172,782 | 234,116,375 | 259,720,041 | 230,229,406 |
| දේපල ආයෝජන | | 773,700,000 | 773,700,000 | 773,700,000 | 773,700,000 | - |
| දිගුකාලීන වත්කම් | | - | 757,223,883 | - | - | - |
| ආයෝජන | | 629,225,138 | 897,927,959 | 11,562,359 | 41,869,020 | - |
| | | **1,406,812,107** | **2,433,024,624** | **1,019,378,734** | **1,075,289,061** | **230,229,406** |
| **ජංගම වත්කම්** | | | | | | |
| තොගය | | 3,099,678 | 8,593,926 | 6,288,349 | 13,065,325 | 3,188,671 |
| වෙළඳ හා ලැබිය යුතු දෑ | | 89,212,053 | 80,500,613 | 109,794,476 | 94,355,791 | 20,582,423 |
| මුදල් හා මුදල් සමාන දෑ | | 13,687,035 | 8,743,454 | 34,937,430 | 9,811,954 | 21,250,395 |
| | | **105,998,766** | **97,837,993** | **151,020,255** | **117,233,070** | **45,021,395** |
| **මුළු වත්කම්** | | **1,512,810,873** | **2,530,862,617** | **1,170,398,989** | **1,192,522,131** | **275,250,895** |
| **හිමිකම් හා වගකීම්** | | | | | | |
| **හිමිකම්** | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 966,971,845 | 966,971,845 | 966,971,845 | 966,971,845 | 1,735,107,480 |
| පොදු සංචිත | | 9,996,952 | 9,996,952 | 9,996,952 | 9,996,952 | - |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 536,119,419 | 536,119,419 | 536,119,419 | 536,119,419 | - |
| රඳවාගත් ඉපැයුම් | | (210,289,522) | 515,533,518 | (1,822,330,515) | (1,848,352,455) | (2,369,264,876) |
| විකිණීම සඳහා වූ වත්කම්වලට අදාල සංචිත | | (465,956,132) | (227,559,971) | - | - | - |
| | | **836,842,562** | **1,800,761,763** | **(309,242,299)** | **(335,264,239)** | **(634,157,396)** |
| සුළු කොටස් හිමිකාරීත්වය | | - | - | 651,488,569 | 651,488,569 | - |
| **මුළු හිමිකම්** | | **836,842,562** | **1,800,761,763** | **342,246,270** | **316,224,330** | **(634,157,396)** |
| **ජංගම නොවන වගකීම්** | | | | | | |
| පොලී ගෙවිය යුතු දිගුකාලීන වග. | **10** | - | 8,000,000 | - | 8,000,000 | - |
| දිගු කාලීන වගකීම් | **11** | 492,426,190 | 492,426,190 | 492,426,190 | 492,426,190 | 757,223,883 |
| විශ්‍රාම පාරිතෝෂිත අරමුදල | **12** | 3,297,663 | 18,696,935 | 5,092,094 | 23,837,538 | 1,794,431 |
| විලම්බිත ආදායම් | **13** | - | - | 74,197,970 | 74,197,970 | 74,197,970 |
| | | **495,723,853** | **519,123,125** | **571,716,254** | **598,461,698** | **833,216,284** |
| **ජංගම වගකීම්** | | | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | | 46,502,070 | 81,304,754 | 120,198,304 | 145,800,099 | 73,696,234 |
| පොලී ගෙවිය යුතු ජංගම වගකීම් | | 119,561,262 | 101,020,284 | 119,561,262 | 101,020,284 | - |
| මුදල් හා මුදල් සමාන දෑ | | 14,181,126 | 28,652,691 | 16,676,899 | 31,015,720 | 2,495,773 |
| | | **180,244,458** | **210,977,729** | **256,436,465** | **277,836,103** | **76,192,007** |
| **මුළු වගකීම්** | | **675,968,311** | **730,100,854** | **828,152,719** | **876,297,801** | **909,408,291** |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **1,512,810,873** | **2,530,862,617** | **1,170,398,989** | **1,192,522,131** | **275,250,895** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 30 සිට 33 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 34 සිට 39 දක්වා සටහන් ඇතුලත් වේ.

**අත්සන් කලේ,**

එම්.ජී.ඒ.ටී.ආර්.ජයතිලක - **ගණකාධිකාරී**

මෙම මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනුයේ,

**අත්සන් කලේ,**

එම්.අබ්දුල් රෂීක් - **අධ්‍යක්ෂ**

**අත්සන් කලේ,**

එස්. හුසේන් අහමඩ් බහිලා මහතා - **සභාපති**

2017 ඔක්තෝම්බර් මස 11 වන දින

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

විස්තීරණ ආදායම් හා රදවා ගත් ඉපැයුම් ප්‍රකාශනය

**2016** දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

| | | | පුනප්‍රකාශිත | | | |
|---|---|---|---|---|---|---|
| | | **2016** | **2015** | **2016** | **2015** | **2016** |
| | | **ශ්‍රී.සි.ස.** | **ශ්‍රී.සි.ස.** | ඒකාබද්ධ | ඒකාබද්ධ | පරිපාලිතය |
| | සටහන් | රු. | රු. | රු. | රු. | රු. |
| ආදායම | **15** | 64,220,735 | 40,570,803 | 174,082,698 | 94,747,914 | 111,688,170 |
| විකුණුම් පිරිවැය | උප ලේඛන **I** | (66,524,748) | (50,781,481) | (173,224,405) | (99,644,640) | (108,525,864) |
| **දළ ලාභය/(අලාභය)** | | **(2,304,013)** | **(10,210,678)** | **858,293** | **(4,896,726)** | **3,162,306** |
| වෙනත් ආදායම් | **16** | 91,541,806 | 60,043,458 | 124,175,893 | 73,883,163 | 32,634,087 |
| බෙදාහැරීම් වියදම් | උප ලේ. **II** | (292,125) | (1,198,403) | (5,000,825) | (1,205,443) | (4,708,700) |
| පරිපාලන වියදම් | උප ලේ. **III** | (41,171,722) | (30,460,889) | (77,812,976) | (57,469,817) | (36,641,254) |
| මුල්‍ය වියදම් | **17** | (15,703,919) | (15,334,407) | (15,829,261) | (15,443,645) | (125,342) |
| **බදු පෙර ලාභය/(අලාභය)** | | **32,070,027** | **2,839,081** | **26,391,124** | **(5,132,468)** | **(5,678,903)** |
| බදු පිරිවැය | | (369,184) | (255,464) | (369,184) | (332,007) | - |
| **බදු පසු ලාභය/(අලාභය)** | | **31,700,843** | **2,583,617** | **26,021,940** | **(5,464,475)** | **(5,678,903)** |
| **විස්තීරණ ආදායම්/(වියදම්)** | | | | | | |
| මුල්‍ය වත්කම් වලින් ලද ආදායම් | **19** | (995,620,044) | 140,870,459 | - | - | - |
| **මුළු විස්තීරණ ආදායම්/(වියදම්)** | | **(963,919,201)** | **143,454,076** | **26,021,076** | **(5,464,475)** | **(5,678,903)** |
| වර්ෂ ආරම්භයේ රදවාගත් ඉපැයුම් | | 287,673,547 | 144,219,471 | (1,848,352,455) | (1,842,887,980) | (2,363,585,973) |
| වර්ෂ අවසානයේ රදවාගත් ඉපැයුම් | | **(676,245,654)** | **287,673,547** | **(1,822,330,515)** | **(1,848,352,455)** | **(2,369,264,876)** |

**Total comprehensive income/(expenses attributable to**

| | |
|---|---|
| පරිපාලකගේ හිමිකාරීත්වය | (3,546,475) |
| සුළු කොටස් හිමිකාරීත්වය | (2,132,428) |
| | **(5,678,903)** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මුල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 30 සිට 33 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 34 සිට 39 දක්වා සටහන් ඇතුලත් වේ.

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය
## **2016** දෙසැම්බර් **31**න් අවසන් දිනට

රු.

| *ඒකාබද්ධ* | **01.01.2015** දිනට ශේෂය | **2015** වර්ෂයේ | **31.12.2015** දිනට ශේෂය | **2016** වර්ෂයේ | **31.12.2016** දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ප්‍රකාශිත ප්‍රග්ධනය | | | | | |
| - පරිපාලකගේ හිමිකාරීත්වය | 966,971,845 | - | 966,971,845 | - | 966,971,845 |
| - සුළු කොටස් හිමිකාරීත්වය | 651,488,569 | - | 651,488,569 | - | 651,488,569 |
| පොදු සංචිත | 9,996,952 | - | 9,996,952 | - | 9,996,952 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 536,119,419 | - | 536,119,419 | - | 536,119,419 |
| රඳවාගත් ඉපැයුම් | (1,842,887,980) | (5,464,475) | (1,848,352,455) | 26,021,940 | (1,822,330,515) |
| **එකතුව** | **321,688,805** | **(5,464,475)** | **316,224,330** | **26,021,940** | **342,246,270** |

| *ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව* | **01.01.2015** දිනට ශේෂය | **2015** වර්ෂයේ | **31.12.2015** දිනට ශේෂය | **2016** වර්ෂයේ | **31.12.2016** දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ප්‍රකාශිත ප්‍රග්ධනය | 966,971,845 | - | 966,971,845 | - | 966,971,845 |
| පොදු සංචිත | 9,996,952 | - | 9,996,952 | - | 9,996,952 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 536,119,419 | - | 536,119,419 | - | 536,119,419 |
| රඳවාගත් ඉපැයුම් | 512,649,901 | 2,583,617 | 515,233,518 | (725,523,040) | (210,289,522) |
| විකිණීම සඳහා වූ වත්කම්වලට අදාල සංචිත | (368,430,430) | 140,870,459 | (227,559,971) | (238,396,161) | (465,956,132) |
| **එකතුව** | **1,657,307,687** | **143,454,076** | **1,800,761,763** | **(963,919,201)** | **836,842,562** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 30 සිට 33 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 34 සිට 39 දක්වා සටහන් ඇතුලත් වේ.

**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් දිනට**

| | සටහන් | **2016** | **2015** | **2016** | **2016** |
|---|---|---|---|---|---|
| | | **ශ්‍රී.සි.ස.** | **ශ්‍රී.සි.ස.** | ඒකාබද්ධ | ඒකාබද්ධ |
| | | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | | | | |
| බදු පෙර ලාභය /(අලාභය) | | 32,070,027 | 2,583,617 | 26,391,124 | (5,678,903) |
| **මුදල් ලෙස ජනිත නොවූ ආදායම් /(වියදම්) ගැලපීම** | | | | | |
| දේපල පිරියත උපකරණවල ක්ෂය | 08 | 318,519 | 1,457,422 | 5,761,551 | 5,443,032 |
| විශ්‍රාම පාරිතෝෂිත වෙන්කිරීම් | 12 | 3,408,375 | 923,388 | 7,103,845 | 3,695,470 |
| පෙර වර්ෂ වලට අදාල ගැලපීම් | | - | (347,072) | (1,337,262) | (1,337,262) |
| තැම්පතු මත පොළී ආදායම් ලැබීම් | | (1,718,277) | (2,269,769) | (737,615) | 980,662 |
| ආර්ථික සේවා ගැස්තු වියදම් | | 1,065,027 | - | 1,246,185 | 181,158 |
| වෙන්කිරීම් | | - | - | 175,442 | 175,442 |
| තොග හානි | | 129,812 | - | 129,812 | - |
| වත්කම් විකිණීමෙන් ලද ලාභ | | (9,220,284) | - | (9,220,284) | - |
| | | **26,053,199** | **2,347,586** | **29,512,798** | **3,459,599** |
| **මෙහෙයුම් වත්කම් හා වගකීම් වල වූ වෙනස්කම්** | | | | | |
| තොගයේ සිදු වූ අඩුවීම්/(වැඩිවීම්) | **11** | 5,494,248 | 9,752,318 | 6,776,976 | 1,282,728 |
| වෙළඳ හා ලැබිය යුතු දැහි අඩුවීම්/(වැඩිවීම්) | **12** | (8,711,440) | 17,457,288 | (15,438,685) | (6,727,245) |
| ගෙවිය යුතු බැංකු ණය පොලියේ (අඩුවීම්)/වැඩිවීම | **10** | 10,540,978 | - | 10,540,978 | - |
| ගෙවිය යුතු දැහි (අඩුවීම්)/වැඩිවීම | **17** | (34,802,684) | 24,814,508 | (25,601,794) | 9,200,890 |
| | | **(1,425,699)** | **54,371,700** | **5,790,273** | **7,215,972** |
| **අඩු කිරීම්** | | | | | |
| විශ්‍රාම පාරිතෝෂිත ගෙවීම් | **16** | (17,583,390) | (1,620,278) | (24,625,032) | (7,041,642) |
| බදු ගෙවීම් | | (163,388) | - | (163,388) | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **(19,172,477)** | **(57,751,422)** | **(18,998,147)** | **174,330** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | | | | |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් | **08** | (121,752) | (18,180) | (246,931) | (125,179) |
| දේපල පිරියත හා උපකරණ විකිණීම් | | 8,008,050 | - | 8,008,050 | - |
| වෙනත් වත්කම් විකිණීම් | | 190,400 | - | 190,400 | - |
| ආයෝජන ලබාගැනීම් | **06** | 32,229,016 | - | 32,229,016 | - |
| ආයොජනයන් සිදු කිරීම් | **06** | (1,718,277) | 228,973 | 18,281,723 | 20,000,000 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **38,587,437** | **210,793** | **58,462,258** | **19,874,821** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | | | | |
| ණය ලබා ගැනීම් හා ගෙවීම් | **10** | - | 5,018,545 | - | - |
| දිගුකාලීන ගෙවිය යුතු දැ ගෙවීම | **10** | - | (27,066,287) | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **-** | **(22,047,742)** | **-** | **-** |
| මුදල් හා මුදල් සමාන දැහි වැඩිවීම/ අඩුවීම් | | **19,414,960** | **30,914,473** | **39,464,111** | **20,049,151** |
| මුදල් හා මුදල් සමාන දැහි වර්ෂ ආරම්භක ශේෂය | | (19,909,051) | (50,823,524) | (21,203,580) | (1,294,529) |
| **මුදල් හා මුදල් සමාන දැහි වර්ෂ අවසාන ශේෂය** | | **(494,091)** | **(19,909,051)** | **18,260,531** | **18,754,622** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 30 සිට 33 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 34 සිට 39 දක්වා සටහන් ඇතුලත් වේ.

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
**2016** දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

### 1.සාමාන්‍ය තොරතුරු

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.
ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම "ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව" ලෙස සංශෝධනය කරන ලදි. මෙහි ප්‍රධාන කාර්යාලය අංක 130, ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා ඇත. වර්තමානයේ මෙහි ප්‍රධාන කාර්යයන් ලෙස සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීම සහ කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන නිපද වීම හා අලෙවිය සිදු කරනු ලබයි.

ලංකා සිමෙන්ති සමාගමේ ආසන්න හා අවසාන හිමිකාරීත්වය දරනුයේ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වේ.

### 2.වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සඳහන් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනසක් සිදු කල බව සඳහන් වෙනම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වර්ෂය පුරාම ඒකාකාරිව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගෙන ඇත.

#### 2.1.මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රකාශිත වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිත අතර එය ආසන්න රුපියලට වටයා ඇත.

#### 2.1.1.දිගුකාලීන පැවැත්ම

ආයතනයේ අධ්‍යක්ෂවරුන් විසින් ආයතනයේ දිගුකාලීන පැවැත්ම පිළිබඳ අධ්‍යනයක් සිදු කර දිගුකාලීන පැවැත්මට ඇති හැකියාව පිළිබඳ සොයා බැලිය යුතු අතර ආයතනය ඇවර කිරීමක් හෝ අහෝසි කිරීමක් සිදු කිරීමට අදහස් නොකල යුතුවේ.

#### 2.2.ආශ්‍රිතයන්හි කරන ලද ආයෝජනයන්

#### 2.2.1.පරිපාලිතයන්

1981වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ රු.1,083,618,910/-ක් ආයෝජනය කල අතර එහි 62.45%ක කොටස් හිමිකාරීත්වයක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට හිමිය. එහි සම මිල රු.10/-කි. මෙම ආයෝජනයට මේ වන තුරු ප්‍රතිලාභ ලැබී නොමැත.
මෙම ආයෝජනය පිරිවැයට පොත්වල සටහන් කර තිබූ අතර 2013 වර්ෂයේ සිට එය වෙළඳපොළ අගය පදනම් කර ගනිමින් ගිණුම්ගත කර ඇත. එහිදී හඳුනාගනු ලබන අලාභ තත්වයන් අදාළ වර්ෂයේදී විස්තීරණ වියදම් යටතේ දක්වනු ලබන අතර ඒවායේ එකතුන් හිමිකම් යටතේ විකිණීම සඳහා වූ වත්කම්වලට අදාල සංචිත ලෙස දක්වනු ලැබේ.

#### 2.2.2.ආශ්‍රිතයන්

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ලෆාජ් සිමෙන්ති සමාගමේ රු.6,400,000/-ක් ආයෝජනය කර ඇත. එය පිරිවැයට පොත්වල සටහන් කර ඇත.

මෙම ආයෝජනයන්ට අදාලව ලාභාංශ ලැබීමක් වේනම් එම ලැබීම වෙනත් ආදායම් ශීර්ෂය යටතේ දක්වනු ලැබේ.

2.3.අයභාරය හඳුනාගැනීම

සිමෙන්ති ආනයනය කර බෙදා හැරීම සහ කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම තුලින් ජනිත වන ආදායම් සහ ඊට අදාල වියදම් , එහි ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒමේ සම්භාවිතාවය සැලකිල්ලට ගනිමින් විශ්වාසවන්ත පදනමක් මත කාලපරිච්ඡේදයට අදාල ප්‍රමාණය මිනුම් කර හඳුනාගනු ලැබේ.

අ. භාණ්ඩ විකිණීම

කාලපරිච්ඡේදයට අදාල භාණ්ඩ විකිණීම් ආදායම හඳුනාගනු ලබනුයේ විකුණූ භාණ්ඩවල අවධානම හා එවායේ අයිතිය ගැනුම්කරු වෙත පැවරීමෙන් පසුව වේ.

ආ. සේවා සැපයීම

සේවා සැපයීමට වෙනුවෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබනුයේ එම සේවයෙන් සම්පූර්ණ කරන ලද ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් හා ඊට අදාලව ගිවිසුමේ ඇස්තමේන්තුගත කල සම්පූර්ණ මිනිස් පැය  ප්‍රමාණය, භාවිතා කරන ලද මිනිස් පැය ප්‍රමාණය සැලකිල්ලට ගනිමිනි.
ගිවිසුමට අදාල ආදායම් විශ්වාසනීයව මැනිය නොහැකි වූ විට ඊට දරණ ලද වියදම් පදනම් කරගනිමින් ආදායම් හඳුනා ගනු ලැබේ.

ඇ.පොලී

කාල අනුපාතය පදනම් කර ගනිමින් මෙම පොලී ආදායම් හඳුනාගනු ලබනුයේ වත්කම්වලට අදාල සඵල පොලී අනුපාතය සැලකිල්ලට ගනිමිනි.

ඇ.වෙනත්

උපචිත පදනම මත වෙනත් ආදායම් හඳුනා ගනු ලැබේ.

2.4.රජයෙන් ලද ලැබීම්

ආදායම් ස්භාවයේ ප්‍රදානයන් හා සහනාධාර

ආයතනය විසින් දැරිය යුතු වූ යම් වියදමක් හෝ පාඩුවක් වෙනුවෙන් ලද නැවත ගෙවිය යුතු නොවන ප්‍රදානයක් හෝ සහනාධාරයක් ලැබීම එම වියදම හෝ පාඩුව හඳුනාගන්නා ලද කාලපරිච්ඡේදයට අදාල වන පරිදි ක්‍රමානුකූල පදනමක් යටතේ ගිණුම්ගත කරනු ලැබේ.

2.5.ණය පිරිවැය

යම් කාලපරිච්ඡේදයක් තුල දරණ ලද ණය සඳහා වූ පිරිවැය එම කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

2.6.ආදායම් බදු

කාලපරිච්ඡේදයට අදාල බදු පෙර ශුද්ධ ලාභයට/(අලාභයට) කරනු ලබන එකතු කිරීම් හා අඩුකිරීම් වලින් පසු අදාල වන බදු අනුපාතය ඊට ගැලපීමෙන් පසු ලැබෙනුයේ ආදායම් බදු පිරිවැය වේ.

කාලපරිච්ඡේදයට අදාල ආදායම් බදු පිරිවැයෙන්, කාලපරිච්ඡේදය තුල ගෙවන ලද ආදායම් බදු ගෙවීම් හා ආර්ථික සේවා ගාස්තු ලෙස හිලව් කර ගත හැකි ප්‍රමාණයන් ගැලපීම් කිරීමෙන් ලැබෙන අගය ගෙවිය යුතු ආදායම් බදු ලෙස හඳුනාගනු ලැබේ.

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
**2016** දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

2.7.දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ වල වටිනාකම මනිනු ලබනුයේ ඒවායේ පිරිවැයෙන් ඊට අදාල සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි අඩුකිරීමෙනි.

ක්ෂය වීම් ගණනය කිරීමේදී සෘජු ක්‍රමය භාවිතා කරන අතර එහිදී අදාල වත්කමේ පිරිවැයෙන් එහි අවශේෂ පිරිවැය අඩුකර එම වටිනාකම වත්කමේ ඵලදායී ජීව කාලය පුරා ඇස්තමේන්තු කිරීමෙනි.

ක්ෂය ගණනයේදී පහත දැක්වෙන වාර්ෂික ක්ෂය අනුපාත පදනම් කර ගනු ලැබේ.

| **විස්තරය** | **ක්ෂය අනුපාතය** |
|---|---|
| ගොඩනැගිලි | 6.67% |
| යන්ත්‍ර සූත්‍ර | 12.5% |
| පස් ප්‍රවාහන යන්ත්‍ර හා බර යන්ත්‍රෝපකරණ | 25.0% |
| මොටර් රථ වාහන | 25.0% |
| මෙවලම් හා උපකරණ | 25.0% |
| ලී බඩු හා සවිකිරීම් | 25.0% |
| රේල් පීලි | 10.0% |

වත්කමට අදාල ක්ෂය අනුපාතයන්හි ඵලදායී ජීව කාලයෙහි හෝ අවශේෂ පිරිවැයෙහි සැලකිය යුතු වෙනසක් සිදු වේ නම් එම වත්කම ක්ෂය කිරීම අතීත කාලයට බලපාන පරිදි ගැලපීම් කරනු ලැබේ.
රු.10,000/-ට අඩු වටිනාකමක් සහිත දේපල පිරියත උපකරණ ප්‍රාග්ධනිත නොකිරීම හා එය මිලදී තනු ලැබූ වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

2.8.ආයෝජන වත්කම්

අ.පුත්තලම, අරුවක්කාලුහි පිහිටි ඉඩම

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් අක්කර 5,352කින් යුතු ඉඩම 1993වසරේදී 50ක කාලයකට හොලිසීම් ලංකා සමාගමට බදු ගිවිසුමක් යටතේ බදු දී ඇත.
මෙම ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර එය ලද විගස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

ආ.කොල්ලුපිටියේ පිහිටා ඇති ඉඩම

මෙම ඉඩමෙහි වටිනාකම ගිණුම්ගත කර ඇති අතර Standing Cabinet Appointed Review Comitteeහි නිර්දේශය මත විදේශීය ආයොජකයෙකුට වසර 99කට කල්බදු වශයෙන් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

2.9.කල්බදු

කල්බදු වර්ගීකරණයේදී මූල්‍ය කල්බදු ලෙස හඳුනාගනු ලබනුයේ කල්බද්ධට අදාල වත්කමේ අයිතියෙහි අවධානම හා විපාකය කල්බදු දෙනු ලබන අවස්ථාවේදීම ආයතනයට මාරු වන්නේ නම් පමණි. අනෙකුත් කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස හඳුනාගනු ලැබේ.

මූල්‍ය කල්බදු වත්කම්හි සාධාරණ අගය ( කල්බදු වාරිකයන්හි වර්තමාන වටිනාකම යන දෙකෙන් අඩු අගය) පදනම් කර ගනිමින් ආයතනය සතු වත්කමේ වටිනාකම සඳහනාගනු ලැබේ. කල්බදු හිමියා විසින් මෙහි වන වගකීම ඔහුගේ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ. කල්බදු වාරිකය තුල කල්බදු සඳහා වන පොලීය හා කල්බදු වගනීමෙන් අඩු වන ප්‍රමාණයද අඩංගු වේ. කල්බදු සඳහා වන පොලිය වියදමක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ. මූල්‍ය කල්බදු යටතේ අත්පත් කරගනු ලැබූ වත්කම් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ නිරූපණය කරනු ලැබේ.
මෙහෙයුම් කල්බදු යටතේ ගෙවනු ලබන වාරික ගෙවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වියදම් යටතේ නිරූපණය කරනු ලැබේ.

2.10.තොගය

තොගයෙහි වටිනාකම ලෙස ගිණුම්ගත කරනුයේ එහි පිරිවැය හෝ විකුණුම් අගයෙන් විකුණුම් හා සම්බන්ධ පිරිවැයන් අඩුකල පසු ලැබෙන අගය යන දෙකෙන් අඩු අගය වේ.

එනම් තොග සහ කෙරෙමින් පවතින වැඩ, ගත්මිල අනුව හෝ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු කිරීමෙනි.

පිරිවැය ගණනයේදී ප්‍රථමයෙන් ලද තොග ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය සැලකිල්ලට ගනු ලැබේ.

2.11.වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

බොල් ණය සහ අඩමාන ණය වෙනුවෙන් ප්‍රතිපාදන ඉන්වොයිස් වටිනාකමින් අඩුකොට ලැබෙන වටිනාකම වෙළඳ ණයගැතියන් ලෙස දක්නු ලැබේ.

2.12. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

ණය පදනම යටතේ මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා වෙනුවෙන් ඇති වන මෙම වගකීම් පොලී අය කිරීමකින් තොර වේ.

විදේශීය ගනුදෙනු සම්බන්ධයෙන් ඇති වන වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්ථනය කර ගිණුම්ගත කරන ඇතර ඉන් ඇති වන විදේශීය මුදල් හුවමාරු ලාභ / (අලාභ) වේ නම් එය වෙනත් ආදායම් යටතේ නිරූපණය කරනු ලැබේ.

2.13.බැංකු ණය හා අයිරා පහසුකම්

බැංකු ණය හා අයිරා පහසුකම් සඳහා වන පොලී ගණනයේදී සඵල පොලී අනුපාතයන් පදනම් කර ගනු ලබන අතර එය මූල්‍ය වියදම් යටතේ නිරූපණය කරනු ලැබේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
**2016 දෙසැම්බර් 31න් අවසන් දිනට**

**03. දේපල පිරියත හා උපකරණ**

**3.1 ඒකාබද්ධ**

| පිරිවැය | 01.01.2016 දිනට ශේෂය | වර්ෂය තුල වූ එකතු කිරීම් | වර්ෂය තුල වූ අඩු කිරීම් | 31.12.2016 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 75,949,097 | - | - | 75,949,097 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 197,339,442 | - | 20,000,000 | 177,339,442 |
| මොටර් රථ | 15,778,008 | - | 10,829,589 | 4,948,419 |
| ලී බඩු හා සවිකිරීම් | 12,519,279 | 143,236 | - | 12,662,515 |
| මෙවලම් හා උපකරණ | 1,277,823 | 30,255 | - | 1,308,078 |
| ගිණුම්කරණ මෘදුකාංග | - | 73,440 | - | 73,440 |
| | **302,863,649** | **246,931** | **30,829,589** | **272,280,991** |

| සමුච්චිත ක්ෂය | 01.01.2016 දිනට ශේෂය | වර්ෂයට අදාල ක්ෂය කිරීම් | වර්ෂය තුල වූ අඩු කිරීම් | 31.12.2016 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 4,768,586 | 1,513,476 | - | 6,282,062 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 11,840,367 | 3,946,788 | - | 15,787,155 |
| මොටර් රථ | 13,133,063 | 224,637 | 10,784,892 | 2,572,808 |
| ලී බඩු හා සවිකිරීම් | 12,168,166 | 73,944 | - | 12,242,110 |
| මෙවලම් හා උපකරණ | 1,233,426 | 37,875 | - | 1,271,301 |
| ගිණුම්කරණ මෘදුකාංග | - | 9,180 | - | 9,180 |
| | **43,143,608** | **5,805,900** | **10,784,892** | **38,164,616** |
| **ශුද්ධ පොත් අගය** | **259,720,041** | | | **234,116,375** |

**3.2 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

| පිරිවැය | 01.01.2016 දිනට ශේෂය | වර්ෂය තුල වූ එකතු කිරීම් | වර්ෂය තුල වූ අඩු කිරීම් | 31.12.2016 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 1,595,981 | - | - | 1,595,981 |
| මොටර් රථ | 15,392,480 | - | 10,829,589 | 4,562,891 |
| ලී බඩු හා සවිකිරීම් | 5,512,601 | 91,497 | - | 5,604,098 |
| මෙවලම් හා උපකරණ | 1,194,398 | 30,255 | - | 1,224,653 |
| | **23,695,460** | **121,752** | **10,829,589** | **12,987,623** |

| සමුච්චිත ක්ෂය | 01.01.2016 දිනට ශේෂය | වර්ෂයට අදාල ක්ෂය කිරීම් | වර්ෂය තුල වූ අඩු කිරීම් | 31.12.2016 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 307,399 | 26,412 | - | 333,811 |
| මොටර් රථ | 12,747,535 | 224,637 | 10,784,892 | 2,187,280 |
| ලී බඩු හා සවිකිරීම් | 5,317,743 | 73,944 | - | 5,391,687 |
| මෙවලම් හා උපකරණ | 1,150,001 | 37,875 | - | 1,187,876 |
| | **19,522,678** | **362,868** | **10,784,892** | **9,100,654** |
| **ශුද්ධ පොත් අගය** | **4,172,782** | | | **3,886,969** |

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු නො.287, ගාලු පාර, කොළඹ 02 ලිපිනයෙහි පිහිටි ඉඩමේ වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය තුල ඇතුලත් වේ. මෙම ඉඩම උගස් බැදුම්කර අංක 2426 යටතේ රු.172,000,000/-ක් දක්වා ණය පහසුකම් ලබා ගැනීමට උගස් කර ඇත. එසේම මෙම ඉඩම 2013 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර ඇත.

එසේම පුත්තලම පාලාවිහි පිහිටි අක්කර 221කින් යුතු ඉඩමේ අක්කර 152ක් සඳහා 2013 වර්ෂයේදී තක්සේරු කල අතර එම ප්‍රත්‍යාගණනය ගිණුම්ගත කර ඇත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි අක්කර 751කින් යුතු ඉඩමේ වටිනාකම ගිණුම්ගත කර නොමැත. ඉන් අක්කර 231ක් පිඹුරුපත් අංක ඒ 2099 යටත් රජයෙන් ලද ඉඩමක් වන අතර ඉතිරි ප්‍රමාණය වන අක්කර 520 පිඹුරුපත් අංක ඒ1557, ඒ1484, ඒ1562 හා ඒ2438 හි ඇතුලත් වන අතර 1964 අංක 14,012දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැසට් පත්‍ර යේ වගන්ති අංක 460 යටතේ වන්දි ගෙවා අත්ලත් කරගෙන ඇත.

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පිහිටා ඇති අක්කර 6කින් යුත් සංස්ථාව සතු ඉඩමේ වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය තුල ඇතුලත් වේ. සංස්ථාවේ අනුමැතියකින් තොරව සුනාමි නිවාස , ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මුල් වී ඉදිකර ඇති බැවින් මීට සුදුසු වන්දි මුදලක් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සදහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
**2016 දෙසැම්බර් 31න් අවසන් දිනට**

**3.3 පරිපාලිතය - ලංකා සිමෙන්ති සමාගම**

| පිරිවැය | 01.01.2016 දිනට ශේෂය | වර්ෂය තුල වූ එකතු කිරීම් | වර්ෂය තුල වූ අඩු කිරීම් | 31.12.2016 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 74,353,116 | - | - | 74,353,116 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 197,339,442 | - | 20,000,000 | 177,339,442 |
| මොටර් රථ | 385,528 | - | - | 385,528 |
| ලී බඩු හා සවිකිරීම් | 7,006,678 | 51,739 | - | 7,058,417 |
| මෙවලම් හා උපකරණ | 83,425 | - | - | 83,425 |
| ගිණුම්කරණ මෘදුකාංග | - | 73,440 | - | 73,440 |
| | **279,168,189** | **125,179** | **20,000,000** | **259,293,368** |

| සමුච්චිත ක්ෂය | 01.01.2016 දිනට ශේෂය | වර්ෂයට අදාල ක්ෂය කිරීම් | වර්ෂය තුල වූ අඩු කිරීම් | 31.12.2016 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 4,461,187 | 1,487,064 | - | 5,948,251 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 11,840,367 | 3,946,788 | - | 15,787,155 |
| මොටර් රථ | 385,528 | - | - | 385,528 |
| ලී බඩු හා සවිකිරීම් | 6,850,423 | - | - | 6,850,423 |
| මෙවලම් හා උපකරණ | 83,425 | - | - | 83,425 |
| ගිණුම්කරණ මෘදුකාංග | - | 9,180 | - | 9,180 |
| | **23,620,930** | **5,443,032** | **-** | **29,063,962** |
| **ශුද්ධ පොත් අගය** | **255,547,259** | | | **230,229,406** |

**04. ආයෝජන වත්කම්**

| | 2016 ශ්‍රී.සි.ස. රු. | 2015 ශ්‍රී.සි.ස. රු. | 2016 ඒකාබද්ධ රු. | 2015 ඒකාබද්ධ රු. | 2016 පරිපාලිතය රු. |
|---|---|---|---|---|---|
| ඉඩම - කොළඹ 02 | 712,500,000 | 712,500,000 | 712,500,000 | 712,500,000 | - |
| ඉඩම - පාලාවි | 61,200,000 | 61,200,000 | 61,200,000 | 61,200,000 | - |
| | **773,700,000** | **773,700,000** | **773,700,000** | **773,700,000** | **-** |

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් මෙම ඉඩම්වල වටිනාකම් ආයෝජන වත්කම් ලෙස සාධාරණ අගය මත ලංකා ගණකාධිකරණ ප්‍රතිපත්ති අංක 40 (ආයෝජන වත්කම්) හිප්‍රතිපාදන අනුව හදුනාගෙන ඇත. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2013 ඔක්තෝම්බර් මස02 වන දින නිකුත් කරන ලද තක්සේරු වාර්තාව පදනම් කරගනිමින් මෙම වටිනාකම් ගිණුම්ගත කර ඇත.

**05. දිගුකාලීන වත්කම්**

| | 2016 ශ්‍රී.සි.ස. | 2015 ශ්‍රී.සි.ස. | 2016 ඒකාබද්ධ | 2015 ඒකාබද්ධ | 2016 පරිපාලිතය |
|---|---|---|---|---|---|
| ලංකා සිමෙන්ති සමාගම ස්ථාපිත කිරීමට අදාළ දිගු කාලීන හා කෙටි කාලීනව ලැබිය යුතු වූ දෑ | 424,169,977 | 424,169,977 | 424,169,977 | - | - |
| ලංකා සිමෙන්ති සමාගම හා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව අතර සිදු වූ අභ්‍යන්තර ගනුදෙනු සදහා ලැබිය යුතු වූ දෑ | 333,053,906 | 333,053,906 | 333,053,906 | - | - |
| ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ වෙනුවෙන් කරන ලද වෙන්කිරීම් | (757,223,883) | - | (757,223,883) | - | - |
| | **-** | **757,223,883** | **-** | **-** | **-** |

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

### ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන සදහා වු ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්

### 2016 දෙසැම්බර් 31න් අවසන් දිනට

රු.

| | | 2016 ශ්‍රී.සි.ස. | 2015 ශ්‍රී.සි.ස. | 2016 ඒකාබද්ධ | 2015 ඒකාබද්ධ | 2016 පරිපාලිතය |
|---|---|---|---|---|---|---|
| **06.** | **ආයෝජන** | | | | | |
| | භාණ්ඩාගාර බැදුම්කර | 5,162,359 | 35,469,020 | 5,162,359 | 35,469,020 | - |
| | ***<u>පරිපාලිත හා ආශ්‍රීතයන්ගේ වු ආයෝජන</u>*** | | | | | |
| | පරිපාලීත - ලංකා සිමෙන්ති සමාගම | 617,662,779 | 856,058,939 | - | - | - |
| | ලෆාජ් සිමෙන්ති (පෞද්ගලික) සමාගම | 6,400,000 | 6,400,000 | 6,400,000 | 6,400,000 | - |
| | | **629,225,138** | **897,927,959** | **11,562,359** | **41,869,020** | **-** |
| **07.** | **තොගය** | | | | | |
| | කොන්ක්‍රීට් නිෂ්පාදන අංශයේ අමුද්‍රව්‍ය හා නොනිමි තොග | 238,256 | 995,914 | 238,256 | 995,914 | - |
| | කොන්ක්‍රීට් නිෂ්පාදන අංශයේ නිමි තොග | 2,861,422 | 4,522,162 | 2,861,422 | 4,522,162 | - |
| | සිමෙන්ති තොගය | - | 3,075,850 | 3,188,671 | 7,547,249 | 3,188,671 |
| | | **3,099,678** | **8,593,926** | **6,288,349** | **13,065,325** | **3,188,671** |
| **08.** | **වෙළද හා ලැබිය යුතු දෑ** | | | | | |
| | වෙළද ණයගැතියෝ | 53,269,065 | 42,092,763 | 77,830,172 | 61,928,290 | 24,561,107 |
| | අවිනිශ්චිත ණයගැති වෙන්කිරීම් | (977,166) | (977,166) | (17,554,842) | (18,422,334) | (16,577,676) |
| | ලැබිය යුතු කුලී | 2,410,636 | 1,985,636 | 2,410,636 | 1,985,636 | - |
| | ලැබිය යුතු අගරු වෙක්පත් | 11,445,377 | 11,445,377 | 11,445,377 | 11,445,377 | - |
| | දේශීය ඇණවුම් මත කලින් ලැබීම් | 1,131,622 | 1,131,622 | 1,131,622 | 1,529,999 | - |
| | ලැබිය යුතු තැම්පතු | 1,824,626 | 2,319,846 | 2,280,777 | 2,319,846 | 456,151 |
| | සිමෙන්ති මත ලැබිය යුතු තැම්පතු | 976,971 | 976,971 | 976,971 | 976,971 | - |
| | උත්සව අත්තිකාරම් | 3,375 | 3,375 | 3,375 | 274,747 | - |
| | සේවක ණය | 1,078,545 | 2,388,448 | 1,078,545 | 2,388,448 | - |
| | කලින් ගෙවු වියදම් | 249,008 | 299,607 | 249,008 | 299,607 | - |
| | ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ | 253,579 | 268,430 | 253,579 | 268,430 | - |
| | වැටුප් අත්තිකාරම් | 10,000 | - | 10,000 | - | - |
| | විවිධ අත්තිකාරම් | 245,947 | 245,947 | 245,947 | 245,947 | - |
| | භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ | 48,000 | 48,000 | 48,000 | 48,000 | - |
| | එකතු කල අගය මත බදු | 10,963,244 | 11,294,485 | 10,963,244 | 11,294,485 | - |
| | ආර්ථික සේවා ගාස්තු | 1,421,056 | 3,008,604 | 6,625,012 | 8,212,560 | 5,203,956 |
| | රදවා ගැනීම් බදු | 2,748,462 | 2,748,462 | 3,585,373 | 3,582,948 | 836,911 |
| | වෙනත් ලැබිය යුතු ශේෂ | 1,437,000 | 547,500 | 2,782,346 | 547,500 | 1,345,346 |
| | ලැබිය යුතු පොලී | - | - | 2,790,611 | 2,790,611 | 2,790,611 |
| | NHDAයෙන් ලැබිය යුතු දෑ | 672,706 | 672,706 | 672,706 | 672,706 | - |
| | ලැබිය යුතු බදු | - | - | 1,966,017 | 1,966,017 | 1,966,017 |
| | | **89,212,053** | **80,500,613** | **109,794,476** | **94,355,791** | **20,582,423** |
| **09.** | **මුදල් හා මුදල් සමාන දෑ** | | | | | |
| | බැංකුවේ ඇති මුදල් | | | | | |
| | - ලංකා බැංකුව, ලේක්වීව් ශාඛා | 2,654,122 | 1,696,150 | 3,210,542 | 1,696,150 | 556,420 |
| | - මහජන බැංකුව, විදේශ ශාඛාව | 253,954 | 253,954 | 253,954 | 253,954 | - |
| | - මහජන බැංකුව,ලිබර්ටි ප්ලාසා | 5,982,807 | 6,771,304 | 5,982,807 | 6,771,304 | - |
| | - මහජන බැංකුව, වවුනියාව | 22,046 | 22,046 | 22,046 | 22,046 | - |
| | - මහජන බැංකුව, කන්නාවෙට්ටි | 4,774,106 | - | 4,774,106 | - | - |
| | - කොමර්ෂල් බැංකුව | - | - | 628,981 | 382,580 | 628,981 |
| | - ලංකා බැංකුව | - | - | 24,845 | 24,845 | 24,845 |
| | - මහජන බැංකුව,කෙටිකාලීන තැ | - | - | 20,000,000 | 603,575 | 20,000,000 |
